# ආදරණීය මවකගෙන් ශ්‍රී ලාංකේය දරුවන්ට ඇමතුමක්!



ආදරණීය දුවේ, පුතේ......

අද දවසේ ලෝක ළමා දිනය සමරන ඔබට නිදුක්, නිරෝගී, සුවපත් ළමාවියක් උරුම වේවා!යි ප්‍රථමයෙන්ම හෘදයාංගම සුබ පැතුම් පිරිනමමි.

මෙලොව පවත්නා හොඳම දේ දරුවන්ට හිමි විය යුතු වග මම තරයේ විශ්වාස කරමි. එනිසාවෙන් ඔබට හොඳම රටක් නිර්මාණය කර දීම මාගේ යුතුකමක් ලෙස මම දකිමි. ඔබටත්, ඔබගේ ආදරණීය දෙමාපියන්ටත්, අල්ලසින් හා දූෂණයෙන් තොර රටක් නිර්මාණය කර දීමේ වගකීම මා වෙත පැවරී ඇත.

ඔබගේ දෙමාපියන් සිය දහඩිය, කඳුළු හෙළමින්, දුක් මහන්සියෙන් ඉපයූ මුදල, ඔබට හොඳ අධ්‍යාපනයක් ලබා දීම වෙනුවෙන් හෝ ඔබට හොඳ රැකියාවක් ලබාගැනීම වෙනුවෙන් හෝ තවදුරටත් අනිසි ලෙස කැපකළ යුතු නැත. මාගේ දරුවනට එවන් අත්දැකීමක් උරුම කර දෙන්නට මා කැමති නොවන පරිද්දෙන්ම කිසිවෙකුත්, එවන් අමිහිරි අත්දැකීම්වල බරින්, ඔබගේ සියුමැලි හදවත වෙහෙසනවාට හෝ රිදවනවාට ද මා අකමැති ය .

පසුගිය දශක ගණනාව පුරාවට, වියළී ගිය අරටු නවන්නට අපි උත්සාහ දැරුවෙමු. ළපටි අතු රිකිළිවලට ආදරය, දයාව, කරුණාව රැඳි හදවතින් ඇමතීම ඊට වඩා ඵලදායී බව අපි වටහා ගත්තෙමු. මන්ද අනාගතයේ වියළී ගිය අරටු බවට පත්ව, මෙරටේ ඉදිරි අනාගත නියමුවන් බවට පත්වන්නේ, අද දවසේ ළපටි අතු, රිකිළි ලෙස ළමාවිය ගත කරන ඔබ නිසාවෙනි.

“ගමයි පංසලයි, වැවයි දාගැබයි” යන සංකල්පය මත ගොඩ නැගි, “රහසින්වත් පව් නොකරන, නුදුන් දේ නොගන්නා” සාරධර්ම මත ගොඩ නැගි, අභිමානවත් සංස්කෘතියක් අපට අතීතයේ උරුමව පැවතුණි. ගෝලීයකරණය නම් වූ සුළඟට හසුව අපේ බොහෝ වටිනාකම්, සමාජ හර පද්ධතීන් ගිලිහී ගොස් හමාර ය. අතීතයේ වටිනාකම් නිසාවෙන් ලෝකයාගෙන් අප ලත් කිත් පැසසුම් අද අපට අහිමි ය. ඒ වෙනුවට අද අල්ලස හා දූෂණයෙන් ලොව ඉදිරියෙනි.

අල්ලස හා දූෂණය වැලැක්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් 2019 වසරේදී අප විසින් එළි දක්වන ලදී. එහිදී සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනයක් නිර්මාණය කෙරෙහි වූ, අපගේ අවධානය යොමු වූයේ ඔබේ සුපිළිපන්න බව උදෙසාම ය. එහිලා ගුරු, දෙගුරු අප සැමට සුවිශේෂී වගකීමක් පැවරී ඇත. හෙට දිනයේ පුරවැසියෙකු ලෙස සමාජගත වන ඔබට, කිසිදු බියකින්, සැකයකින් තොරව, අපගේ මව්බිමේ අනාගතය භාර දීමට, අපට හැකි වන්නේ ඔබ සුපිළිපන්න වුවහොත් පමණක්ම ය.

දශක ගණනාවක් පුරාවට අපේ  ශ්‍රී ලංකා මාතාව දුටු සිහිනයක් ඇත. සංවර්ධිත රටක් බවට පත්වීම ඇය දුටු ඒ සිහිනයයි. ඇගේ ඒ සිහිනයට පණ දෙන්නට මේ දක්වාත් අප රටක් ලෙස අසමත් ය. එනිසාවෙන් එම සිහිනයට පණ දීමේ වගකීම දැන් ඔබ සතු ය. එනිසාවෙන් සොඳුරු ළමා දිවියක පහස අත්විඳිමින්, සුහුඹුල් ඔබ, ඔබගේ පියාපත් සවිමත් කර ගත යුතුව ඇත.

අල්ලස හා දූෂණයට එරෙහි වන්නට අද දවසේ ඔබට යුතුකමක් ඇත. අල්ලසින්, දූෂණයෙන් තොර වන්නට හෙට දවසේදී ඔබට වගකීමක් ඇත. ඔබේ උරුමය ඔබට පවරන්නට, සුපිළිපන්න ඔබ සමාජගත වනතෙක් පෙර මග බලා සිටින මම,

ඔබගේ ආදරණීය,
මව,

විනිසුරු ඊවා වනසුන්දර.
සභාපතිනිය.
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

